**සජිත් ප්‍රේමදාස, (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
**சஜித் பிரேமதாச, (பா.உ.)**
எதிர்க்கட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்
**Sajith Premadasa, (M.P.)**
Leader of the Opposition - Parlimaent of Sri Lanka

2023.03.26

**විශ්වවිද්‍යාල අචාර්යවරුන්ගේ අඛණ්ඩ වැඩවර්ජනය හා රුහුණු විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන්ට මාර්තු මාසයේ වැටුප් නොගෙවීම සම්බන්ධව ගරු විපක්ෂ නායකතුමාගේ නිවේදනය!**

ආණ්ඩුවේ අසාධාරණ බදු පණතට එරෙහිව මෙරට වෘත්තිකයන් දැවැන්ත විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කොට දැනට බොහෝ කාලයක් ගත වී තිබේ. සාධාරණ බදු ක්‍රමයක් ඇති කිරීමට වහාම පියවර ගන්නා ලෙස ඔවුන් ආණ්ඩුවට බලකරමින් සිටියි. මේ අතර විශ්වවිද්‍යාල වෘත්තිකයන් අසාධාරණ බදු ක්‍රමයට එරෙහිව පසුගිය මාර්තු 09 වන දින ඇරඹූ අඛණ්ඩ වැඩවර්ජනය දැන් සති දෙකක් දක්වා ඉදිරියට පැමිණ තිබෙන අතර, එය අවසන් වන දිනයක් තවම නිල වශයෙන් නිවේදනය වී නොමැති අතර, තමන්ගේ සාධාරණ ඉල්ලීම සඳහා අඩුම තරමින් අන්තර්වාර විසඳුමක් හෝ ලබා දෙන ලෙස ඔවුන් ඉල්ලා සිටියි.

මෙලස වෘත්තිකයන් හා විශේෂයෙන්ම විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මර්දනීය බදු පණතට විරුද්ධව සටන් කරන මොහොතක, එම සාධාරණ අරගලය අසාධාරණ ලෙස මර්දනය කිරීමට ආණ්ඩුවේ බලධාරීන් විවිධ උපක්‍රම අනුගමනය කරන බව ද පෙනීයයි. ප්‍රජාතන්ත්‍රවාදී සහ අවිහිංසාවාදී මාර්ගයෙන් වෘත්තිකයන් ගෙනයන එම සටන මැඩපැවැත්වීමට ඔවුන්ට එරෙහිව ගෙනයන සදාචාර විරෝධී හා ප්‍රජාතන්ත්‍රවාදයට පටහැනි ක්‍රියා මාර්ග අප තරයේම හෙළා දකිමු.

වැඩවර්ජන මර්දනය කිරීමේ එක් අපකීර්තිමත් උපක්‍රමයක් වශයෙන් වත්මන් පාලනය විසින් වැටුප් නොගෙවා සිටීම වැනි ඉතාම අශිෂ්ට ක්‍රියාමාර්ග වලට පවා එළඹෙමින් තිබීම කණගාටුවට කරුණකි. උදාහරණයක් ලෙස රුහුණු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා ඉතාම අත්තනෝමතික ආකාරයට තම බලය යොදමින් එම විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන්ගේ මාර්තු මාසයේ වැටුප ගෙවීම අත්හිටුවා ඇත. විපක්ෂය ලෙස අප එම ක්‍රියාව දකින්නේ ආණ්ඩුවේ අභිලාසය ක්‍රියාත්මක කිරීමට පරිපාලකයකු දරූ නින්දිත උත්සාහයක් ලෙසය. ප්‍රධාන විපක්ෂය ලෙස අප එම ක්‍රියාව දැඩිව හෙළා දකින අතර, වහාම එම අචාර්යවරුන්ගේ වැටුප ගෙවන ලෙස බලකරමු! එසේ නොවන්නේ නම් එම මූලික අයිතිය උල්ලංඝනයට එරෙහිව ගත හැකි සෑම පියවරක්ම ව්‍යවස්ථාදායක හා අධිකරණය තුළ දී ගන්නා බවට දැනුම් දෙමු!

ආර්ථික අර්බුදය හමුවේ මෙරට වෘත්තික ප්‍රජාවට හා සාමාන්‍ය ජනයාට එල්ලවී ඇති දැවැන්ත පීඩනය හමුවේ ආණ්ඩුවට කිසිම විද්‍යාත්මක ක්‍රමවේදයක් එම ගැටළු විසඳීමට නොමැති බව දැන් හෙළි වී හමාරය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මුවා වෙමින් ගෙනයන මෙම අසාධාරණ ආර්ථික ප්‍රතිපත්තිය හා සුජාත නොවන පාලනය පාරාජය කිරීමට ජනතාව සහ වෘත්තිකයන් පෙරට එන මෙම අවස්ථාවේ, ඔවුන්ගේ අරගලය ශක්තිමත් කිරීමට විපක්ෂයේ ප්‍රධානතම පක්ෂය වන සමගි ජනබලවේගය ඔවුන් සමඟ එක්ව සටන් කිරීමට ඉදිරියට පැමිණෙන බව ප්‍රකාශ කරමු!

**සජිත් ප්‍රේමදාස,**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක සහ
සමගි ජන බලවේගයේ නායක.

සජිත් ප්‍රේමදාස (පා.ම.)
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
විපක්ෂ නායක කාර්යාලය,
අංක.30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ -07

දුරකතන: Telephone: தொலைபேசி: 011 2777253, 011 2699171
ෆැක්ස්: Fax: தொலைநகல்: 011 2699174
විද්‍යුත් තැපෑල: Email: மின்னஞ்சல்: sajith_p@dialogsl.net

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7 I இலக்கம் 30, சர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை கொழும்பு 7 I No 30, Sir Marcus Fernando Mawatha Colombo 7